

# හරි මිනිස්සු පත්කරන එක ජනතාවගේ වගකීමක්

## - පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

ආඩිගම - මිලාන් දේවසිරි

සෑම මැතිවරණයකදීම මේ රටේ ජනතාව ඡන්දය භාවිතා කළ යුත්තේ ගැළපෙන පුද්ගලයන් අදාළ ආයතනවලට යවන්නයි. පාර්ලිමේන්තුව, පළාත් සභාව, ප්‍රාදේශීය සභාව මේ සෑම ගෞරවනීය ස්ථානයකම සිටිය යුත්තේ ගරු කළ යුතු පුද්ගලයන්. නීති හදන්න, ප්‍රතිපත්ති හදන්න, මුදල් කළමනාකරණය කරන්න අපි යවන අය මේවා කරලද කියා සොයා බැලිය යුතුයි. පසුගිය ආණ්ඩු සෑම එකක්ම මේවා නිසි ලෙස කරන්න අසමත් වෙලා.''

පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා එසේ ප්‍රකාශ කළේ පසුගියදා ආණමඩුව සුදම්පාය නගර ශාලාවේදී පැවැති 'අභියෝග හමුවේ සිවිල් සමාජ කාර්ය භාරය' නම් වූ මහජන සංවාදයට එක්වූ අවස්ථාවේදීය. එහිදී තවදුරටත් කරුණු දක්වූ ඒ මහතා,

අපේ රට නිදහස ලබා අවුරුදු 70 ට අධිකයි. තාම අපිට අධ්‍යාපන, සෞඛ්‍ය ප්‍රතිපත්තියක් නෑ. අපේ රටේ මැතිවරණ සංස්කෘතිය අද වන විට විශාල වෙනසකට ලක්වෙලා තිබෙනවා, පෝස්ටර්, කටවුට්, බැනර්, මහා රථ පෙළපාලි අද දකින්න නැති තරම්. මැතිවරණවලදී ජාතිවාදය අවුස්සන්න එපා. කට කැඩිච්ච කතා කියන්න එපා. මනාප ගැටුම් එපා. එවිට අපිට දියුණුම මැතිවරණ සංස්කෘතියකට යන්න පුළුවන්.

බලයට පත්වන අය හැමදාම කියන්නේ අර ආණ්ඩුව මේ ආණ්ඩුව කිසි දෙයක් කරලා නෑ කියලා. ඒකෙන් අදහස් වෙන්නේ දක්ෂයෝ අපි පත්කරලා නැති බවයි.

මේගොල්ලෝ දූෂිතයි කියා වෙන ආණ්ඩුවක් පත්වෙනවා. ටික දවසකින් ඒකෙ ඉන්න අයටත් දූෂණ චෝදනා එල්ල වෙනවා. ඒ නිසා හරි මිනිස්සු පත්කරලා එවන එක ජනතාවගේ වගකීමක්.

මෙහිදී කතා කළ නීතිඥ ප්‍රබෝධ රත්නායක මහතා, කොරෝනාවලින් රටටම හොඳ සෞඛ්‍ය පුරුදු ආවා. ඒ වගේ මේ සමාජ ක්‍රමයේ පවතින ආර්ථික, සමාජ විෂමතාවලටත් විසඳුම් ලබාදිය යුතුයි. ඒවාට ගැළපෙන හොඳ විසඳුම් ලබාදිය යුතුයි. ඒවා ගැලපෙන හොඳ විසඳුම් වනවිට ජනතාව ඒවා වැළඳ ගන්නවා. නීතිය කාටත් එක සමාන විය යුතුයි. මේ රටේ පරමාධිපත්‍ය බලය තිබෙන්නේ ජනතාවටයි. සියලු දෙනාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කළ යුතුයි. මූලික අයිතිවාසිකම්, මානව අයිතීන්, සාධාරණ මැතිවරණ, හිංසාවෙන් බැහැරවීම දියුණු රටක අනිවාර්ය ලක්ෂණයි.'

සාම මණ්ඩල සංවිධායක සමන් සෙනෙවිරත්න මහතා මෙසේ කීවේය.

''එදා ජේ. ආර්. කිව්වා මට කරන්න බැරි දෙයක් නෑ කියලා. එවැනි ප්‍රකාශන භයානකයි රටකට. ඒ නිසයි රටේ ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක විය යුත්තේ. ඒකාධිපති බලය නැතිව යනවා. වර්තමානය වනවිට රටත් ජනතාවත් හොඳ දේශපාලන දැනුමකින් යුක්තයි. ඉස්සර වගේ මැතිවරණවලදී ගහ මරා ගන්නේ නෑ. වෛරී දේශපාලනය අවසන් කළ යුතුයි.

ආණමඩුව සිවිල් සංවිධාන ක්‍රියාකාරි නිමල් අබේසිංහ මහතා මෙම වැඩසටහන සංවිධානය කළේය.